# දුර්භාෂිත නො වන සුභාෂිත ම කථා කරමු

## සුභාසිතවාචා සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 3 - පිටු අංක 392 - 393)

අංග පසකින් යුතු වචන සුභාෂිත (මනා සේ කියන ලද) වෙයි. දුර්භාෂිත (අයහපත්, අශිෂ්ට ලෙස කියන ලද) නොවෙයි. නිවැරදි වෙයි. නුවණැත්තන් විසින් නොගැරහිය යුතු ද වෙයි.

1. සුදුසු කල්හි කියයි.
2. සත්‍ය වූවක් ම කියයි.
3. මොළොක් වචනයෙන් ම කියයි.
4. අර්ථයෙන් යුතු ව ම කියයි.

මෛත්‍රී සහගත සිතින් ම කියයි.